2017-09-27

ස්වාමීන්වහන්ස/මහත්මයාණනි/මහත්මියනි,

# සමාජ විග්‍රහ

***'සමාජ විග්‍රහ' තත්කාලීන සමාජවිද්‍යා ගවේෂණ වාර්ෂික විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රයට (ISSN 2362 – 0978) පර්යේෂණ ලිපි/නිබන්ධන සැපයීම සඳහා ආරාධනා කිරීම***

කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයට අයත් 'සමාජ විග්‍රහ' වාර්ෂික විමර්ශිත ශාස්ත්‍රීය සංග්‍රහයෙහි තෙවැනි වෙළුම පළ කිරීමට කටයුතු යොදා ඇති අතර, ඔබට ඒ සඳහා දායකත්වය සැපයිය හැකි බව සතුටින් දන්වා සිටිමු.

ඔබ/ඔබ ආයතනයේ/දෙපාර්තමේන්තුවේ විද්‍යාර්ථයෙකු/පර්යේෂකයෙකු ඒ සඳහා කැමැත්ත පළ කරන්නේ නම්, මෙම ලිපිය සමඟ අමුණා ඇති උපදේශ ලේඛනයට අනුව සැකසූ සම්පූර්ණ පර්යේෂණ ලිපි/නිබන්ධ 2017 නොවැම්බර් 30 වන දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට අප වෙත ලැබීමට සලස්වන මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ මෘදු පිටපත (Soft Copy) විද්‍යුත් තැපෑලෙන් ද (Email), මුද්‍රිත පිටපත (Hard Copy) ලියාපදිංචි තැපෑලෙන් ද එවිය යුතුය.

'සමාජ විග්‍රහ' තත්කාලීන සමාජවිද්‍යා ගවේශණ ශාස්ත්‍රීය සංග්‍රහය වෙත ඔබ දක්වන බුද්ධිමය දායකත්වය අප බෙහෙවින් අගය කරමු.

මෙයට විශ්වාසී,

...............................................

මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා
අංශ ප්‍රධාන
සමාජවිද්‍යා අධ්‍යයනාංශය

**ප්‍රධාන සංස්කාරක**

මහාචාර්ය ප්‍රේමකුමාර ද සිල්වා

**සංස්කාරකවරු**

ආචාර්ය මොහොමඩ් මහීෂ්
සහකාර කථිකාචාර්ය චන්දිමා දිල්ෂාණි (kumarichandima11@gmail.com)

**ලිපිනය:**

Email: samaja.viggraha.soc.cmb@gmail.com

සංස්කාරක
'සමාජ විග්‍රහ'
සමාජවිද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය කොළඹ03.

# උපදේශ ලේඛනය

## *සමාජ විග්‍රහ: තත්කාලීන සමාජවිද්‍යා ගවේෂණ*

## *Social Analysis: Exploration in Contemporary Sociology*

කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ සංස්කරණ දායකත්වය යටතේ කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශය මඟින් පළ කරන 'සමාජ විග්‍රහ' ශාස්ත්‍රීය සංග්‍රහය සඳහා පර්යේෂණ ලිපි/නිබන්ධන සම්පාදනය කිරීමට බලාපොරොත්තුවන විද්වතුන් මේ උපදේශ ලේඛනය ආශ්‍රය කරන ලෙස සංස්කාරක මණ්ඩලය ඉල්ලා සිටී.

**අරමුණු**

මූලික වශයෙන් සමාජවිද්‍යාවේ හා මානවවිද්‍යාවේ කේන්ද්‍රීය දිශානති ආශ්‍රයෙන් සම්පාදිත පර්යේෂණ නිබන්ධන හා න්‍යායික සාකච්ඡා සහ පුළුල් වශයෙන් සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර ප්‍රවේශ තුළින් ලියැවෙන, තත්කාලීන සමාජවිද්‍යාවට හා මානවවිද්‍යාවට ආලෝකය සැපයිය හැකි නිබන්ධ මෙන්ම ග්‍රන්ථ විමර්ශන ද අඩංගු වාර්ෂික විමර්ශිත සංග්‍රහයක් ලෙස සමාජ විග්‍රහ හැඳින්විය හැකිය. සාමාන්‍ය වශයෙන් මේ සියලුම නිබන්ධ ශ්‍රී ලාංකේය සමාජවිද්‍යාවට ශාස්ත්‍රීය දායකත්වයක් ලබාදිය යුතුය. හුදු විස්තර කථන හෝ සංඛ්‍යා ලේඛන මත පදනම් වූ නිබන්ධ වෙත අවධාණයක් මේ ශාස්ත්‍රීය සංග්‍රහයෙන් නොලැබේ. කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශය මඟින් පවත්වාගෙන යන මෙම ශාස්ත්‍රීය සංග්‍රහයට ඕනෑම අයෙකුට බුද්ධිමය දායකත්වය සැපයිය හැකිය. මෙම ශාස්ත්‍රීය සංග්‍රහය කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශයේ ප්‍රකාශනයක් ලෙස 2014 වසරේ සිට ප්‍රකාශයට පත්කෙරේ.

**'සමාජ විග්‍රහ' වෙත නිබන්ධන සැපයිය හැකි ආකාරය**

01) කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශය විසින් කරන ලද ඇරයුමකට අනුව නිබන්ධන සැපයිය හැකිය.

02) 'සමාජ විග්‍රහ'යේ අරමුණු හා අපේක්ෂාවන්ට අනුකූලව ඕනෑම අයෙකුට ස්වාධීනව නිබන්ධ ඉදිරිපත් කළ හැකිය.

**'සමාජ විග්‍රහ' වෙත නිබන්ධ සපයන ලේඛකයන් සඳහා උපදෙස්**

1) නිබන්ධන තුළ හුදෙක් විස්තර කථන ඇතුළත් නොකළ යුතු අතර, සමාජ හා මානව විද්‍යා විෂය ක්ෂේත්‍රවලට අදාළ තොරතුරු, සමාජ හා න්‍යාය සමඟ ඒකාබද්ධ කිරීම, සාකච්ඡා කිරීම හා විශ්ලේෂණය කිරීම සාමාන්‍යයෙන් සිදුවිය යුතුය.

2) 'සමාජ විග්‍රහ' සඳහා සිංහල භාෂාවෙන් නිබන්ධ ඉදිරිපත් කළ හැකිය. එහිදී සමාජයීය විද්‍යා ලේඛනකරණයේදී ජාත්‍යන්තරව අනුගමනය කරන රචනා ශෛලී හා තාක්ෂණික ප්‍රවණතා හා ප්‍රමිති අනුගමනය කිරීමට වගබලා ගත යුතුය. මෙම ප්‍රමිති උද්ධෘත සටහන්, සමුද්දේශ සටහන්, මූලාශ්‍රය තොරතුරු, පසු සටහන් ආදී සියලුම දේ සඳහා අදාළ වේ. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර සඳහා පහත සඳහන් කෘති වලින් එකක් හෝ අදාල තාක්ෂණික තොරතුරු සපයන වෙනත් ඕනෑම කෘතියක් ආශ්‍රය කරගත හැක.

University of Chicago Press2003. *The Chicago Manual of Style (සංශෝධිත 15 වන සංස්කරණය)* Chicago: University of Chicago Press.

03) 'සමාජ විග්‍රහ' සඳහා නිබන්ධ ඉදිරිපත් කිරීමේදී අක්ෂර සංයෝජනය හා විරාම සලකුණු සිංහල භාෂාවෙන් , එෆ්. එම්. අභය මගින් ඉදිරිපත් කළ යුතු අතර, අක්ෂර ප්‍රමාණය පොයින්ට් 11 විය යුතුය. ඒ සඳහා Adobe Page Maker 7.0 මෘදුකාංගය යොදා ගැනීම අනිවාර්ය වේ. මෙම අවශ්‍යතා සම්පූර්ණ නොකරන නිබන්ධ/ලිපි දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.

04) 'සමාජ විග්‍රහ' වෙත සංක්ෂිප්ත නිබන්ධ ඉදිරිපත් කිරීම අනවශ්‍ය වන අතර, සම්පූර්ණ නිබන්ධ සමග වචන 350ක් පමණ සමන්විත සිංහල භාෂාවෙන් ලියැවුණු සංක්ෂිප්ත සටහනක් (abstract) ඉදිරිපත් කළ යුතුය.

05) මෙම නිබන්ධන සංග්‍රහය සඳහා සපයනු ලබන නිබන්ධ වෙනත් අවස්ථාවල්දී පළ නොවූ ඒවා විය යුතුය.

**'සමාජ විග්‍රහ' සඳහා නිබන්ධ තෝරා ගැනීමේ ක්‍රියාවලිය**

'සමාජ විග්‍රහ' වාර්ෂික නිබන්ධ සංග්‍රහයකි (refereed journal). ඒ සඳහා එවනු ලබන සෑම නිබන්ධනයක්ම සංස්කාරක මණ්ඩලයේ සාමාජිකයෙකු හා විමර්ශන/උපදේශක මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් පරීක්ෂා කරනු ලැබේ. ඉන් අනතුරුව, අමතර සංස්කරණ කටයුතු සිදු කළ යුතු නම්, කතුවරුන් වෙත ලබා දී තිබෙන කාලය තුළ එකී කටයුතු සිදු කිරීමට වගබලා ගතයුතුවේ. යට කී සුදුසුකම් සැපිරූ නිබන්ධයක් 'සමාජ විග්‍රහ' වෙත සැපයූ පසු ඊට අදාළ සියලු තොරතුරු ලිඛිතව කොළඹ විශ්වවිද්‍යාලයේ සමාජවිද්‍යා අධ්‍යයනාංශය විසින් අදාළ රචකයන් වෙත දන්වනු ඇත. එමෙන්ම, 'සමාජ විග්‍රහ' වෙත සැපයෙන සෑම නිබන්ධනයක් සමගම අදාළ කතුවරුන් සමඟ සම්බන්ධීකරණය කළ හැකි ලිපින, විද්‍යුත් තැපැල් ලිපින හා දුරකථන අංක සංස්කාරක මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය. මෙම ක්‍රියාවලිය පිළිබඳව අවිධිමත් ආකාරයෙන් විපරම් කිරීම අනවශ්‍ය වේ.

**උපුටා ගැනීම්**

ලේඛනකරණයේදී උපුටා ගැනීම් යෙදිය යුත්තේ එය අත්‍යවශ්‍යම අවස්ථාවකදී හා කතුවරයාගේ අදහස ශක්තිමත් කිරීමට අවශ්‍ය විටකදී පමණි. යම් තොරතුරක් උපුටා දක්වන සෑම අවස්ථාවකදීම, එය ප්‍රධාන පඨිතයෙන් කැපී පෙනෙන සේ උද්ධෘත පාඨ යෙදීම හෝ දීර්ඝ උපුටා දැක්වීමක් නම්, ප්‍රධාන පඨිතයේ සෙ.මී. 1 බැගින් වම් හා දකුණු සීමා වලින් වෙන් කළ යුතුය. උපුටා ගැනීමට අදාළ මූලාශ්‍රය පිළිබඳ සටහනේ කතුවරයාගේ අවසාන නම, කෘතිය ප්‍රකාශිත වර්ෂය සහ මූලාශ්‍රය ලබාගත් පිටු අංක වරහන් තුළ යෙදිය යුතුය. නැවතීමේ තිත දෙවන වරහනට පසුව විය යුතුය. උදාහරණ ලෙසඃ (වික්‍රමසිංහ 1999ඃ 23-26). මේ නියමය නිබන්ධනය තුළ යෙදෙන සියලුම ද්විතීයික මූලාශ්‍රය සම්බන්ධයෙන් බලපැවැත්වේ. මේ සම්බන්ධයෙන් පහත සඳහන් උදාහරණ සලකා බලන්න.

- මේ කියවීමට අනුව මාටින් වික්‍රමසිංහ සිංහල සංස්කෘතික බුද්ධිමතුන් අතුරින් සම්ප්‍රදාය හා බෞද්ධ මානවවාදය නියෝජනය කරන බව ඉදිරිපත් කර ඇති ප්‍රධානතම තර්කය වේ (වික්‍රමසිංහ 2005ඃ 63-86).
- දිසානායක දක්වන පරිදි මාටින් වික්‍රමසිංහ ...... (2005ඃ 63-86).

**පිටු අග සටහන් යෙදීම (end notes)**

තම නිබන්ධය පුරාවට අනුක්‍රමික පිළිවෙලට අදාළ ස්ථානවලට අංක යෙදිය යුතුය. පිටු අග සටහන් සෑම විටම පඨිතයට අදාළ විය යුතු අතර, පාඨකයාගේ වැඩිදුර දැනගැනීම සඳහා පඨිතය තුළ යෙදීමෙන් එහි ගලා යාමට බාධාවන අමතර කරුණු පමණක් ඊට අන්තර්ගත කළ යුතුය. 'සමාජ විග්‍රහ' සඳහා පිටු අග සටහන් (foot notes) යෙදීම අනුමත නොකෙරේ.

**ආශ්‍රේය ලිපිලේඛන**

නිබන්ධනය තුළ භාවිත කළ, මෙතෙක් සංක්ෂිප්ත ආකාරයෙන් දැක්වූ ආශ්‍රේය ලිපිලේඛනවල සම්පූර්ණ තොරතුරු ඔබගේ ලේඛනය අවසානයේදී 'ආශ්‍රේය ලිපිලේඛන' කොටස තුළ දැක්විය යුතුය. සිංහල භාෂාවෙන් ලියැවුණු පොත් පළමුව ද, ඉංග්‍රීසියෙන් ලියැවුණු පොත් එම භාෂාවෙන්ම දෙවනුව ද සඳහන් කළ යුතුය. ඒ සියලුම ලේඛනවල අදාළ කතුවරුන්ගේ අවසාන නමේ මුලකුරු ඉංග්‍රීසි අකාරාදියේ සඳහන් අනුපිළිවෙලට විය යුතුය. උදාහරණ ලෙසඃ අමරසේකර, ඒ/බණ්ඩාරනායක, එස්.

**පොතක් පිළිබඳ මූලාශ්‍රය සටහන් යෙදීම**

ආශ්‍රේය ලිපිලේඛන සම්පාදනය කිරීමේදී කතුවරයාගේ අවසන් නම පළමුව ද, මුල් නම හෝ අක්ෂර පසුවත් යෙදේ. අදාළ ග්‍රන්ථය පළ වූ වසර, ග්‍රන්ථයේ නම, ප්‍රකාශ කළ ස්ථානය හා ප්‍රකාශකයා ද පහත සඳහන් ලෙසට යෙදිය යුතුය.

ඉලයප්පආරච්චි, එරික්

*2000. කලාත්මක ඥානය සහ සැබෑ ලෝකය: දැවෙන ප්‍රශ්න. මුල්ලේරියාව: විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය.*

**සංස්කරණය කරන ලද ග්‍රන්ථයක මූලාශ්‍රය සටහන් යෙදීම**

ලෙනින්, වී.අයි.

1973. 'ප්‍රතිවිප්ලවයට විරුද්ධව සටන් කරන්නේ කෙසේද?' වී. කාරාසිංහම් (සංස්කරණය), *පුවත්පතේ නිදහස. කොළඹ ජාත්‍යන්තර ප්‍රකාශකයෝ.*

**නිබන්ධ සංග්‍රහයක (journal) පළවී ඇති රචනයක් පිළිබඳ මූලාශ්‍රය සටහන් යෙදීම**

මල්ලිකාරච්චි, ඩෙස්මන්ඩ්

2001. '"කතරගම දෙයියෝ" වෙළඳුන්ගේ දෙවියාය: සිංහල බෞද්ධ වෙළඳුන්ගේ කාය භාෂාව'. *ප්‍රවාද*, අංක 18 (අප්‍රේල් - ජූනි). කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය.

**සැ.යු ඔබගේ මෘදු පිටපත (Soft Copy) විද්‍යුත් තැපෑලෙන් ද (Email), මුද්‍රිත පිටපත (Hard Copy) ලියාපදිංචි තැපෑලෙන් ද එවිය යුතුය.**

**ලිපිනය**

සංස්කාරක/සම්බන්ධීකාරක
'සමාජ විග්‍රහ'
සමාජවිද්‍යා අධ්‍යයනාංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03.

**විද්‍යුත් තැපැල් ලිපිනය**
**samaja.viggraha.soc.cmb@gmail.com**